# ගොවිරජාණෙනි! ගන්න පෙරමුන

(අඹුවන්ගල විද්‍යාලයයේ කෘෂිවිද්‍යා උපාචාර්‍ය
සි. අ. පොඩිරාලහාමි මහතා විසිනි)

උදේ ගියපසු කුඹුරවෙත ඔබ සවසටයි පැලවෙත ඇදෙන්නේ
දිවා අහරක් නොලැබුනත් නැහැ කිසිම විටකදි සිත තැවෙන්නේ
කෙතේ සරුබව දකිනවිට දියි සිනාවක් මුවගට නැගෙන්නේ
ඔබ නැතොත් අපරටේ අන් අය කෙලෙසකද තම දිවි ගෙවන්නේ

උදළු ඇකැති පෝරු වියගස් නගුල් ඈ හැම දේම වේවා
රටේ සාගිනි නිවන්නට පන පෙවී පෙවී ඔබ වෙතට ආවා
පිටට අීතපා කට අයා තම විරිය අනුනට දෙමින් පාවා
සිටිනවුන් මහ දීන පිරිසකි ගොවි රජාණෙනි! ඔබගෙ ගාවා

කොතෙක් යුදබිය ලෝපුරා විහිදුනත් නැත කිසි බියක් වීමට
ඔබේ ශක්තිය නිසා අප වුවමනා නැහැ තව දැත පෑමට
හාල් පොල් ලුනු මිරිස් එලවළු තිබේනම් අප හැමට කෑමට
අනෙක් හැමදේ නැතිවුනත් හැක හැමදෙනාටම දිවි ගෙවීමට

ගැමුණු පැරකුම් රජුන් සමයේ අහර වැඩිවී පිටට යැව්වා
බතේ බලයෙන් මහා ගල්කුළු පෙති පිළිම කර දහම වැව්වා
ගගන ගැබතෙක් උසට දගැබ් සද, වැව් අමුණු ද—බැ— දෙව්වා
අපිත් නිදිගැට හරිමු ! නැගිටිමු !! පාඩමක් කොට ගනිමු ඔව්වා

රටේ ජීවය රැඳී ඇත්තේ ඔබේ අතබව සිතට ඇරගෙන
බතේ සරු බව රටින් පිටටත් පෙන්නවන්නට ගතට වෙරගෙන
අහර වෙනුවෙන් වෙනත් රටවල් ලබන වස්තුව අපම හැරගෙන
තව තවත් දේ වවමු ගොවිතැන් කරමු නොපැකිල වඩා දිරිගෙන

බතින් වේලක් පිරිමසා අල බතල වේලක් ගනිමු සාද
සෑම මුඩුබිම් අපේ බලයෙන් ගනිමු ගොවිබිමකටම ඇඳා
පසේ පොළවේ රැඳුනු සරුබව යොද ධාදිය ගනිමු පාද
මමයි ගොවියා මමයි රජිඳා ලෙසට පෙන්වමු රටට වීද

රටේ හැම දෙන දනි දූන් සාගිනි නිවීමේ පියා ඔබ බව
අගේ දූනගෙන තිබේ රජයද ඔබට දිරිදෙනු ඇත ලෙසින් මව
උදව්වට රජයක් තිබෙද්දී ඉදිරියට එනු මැනවි—නොබි— යව
ඔබට අපරට කිරුල පළදින දිනෝ එතරම් දුරක් නැහැ තව

අපට රජයෙන් ලැබෙන උපදෙස් ලෙසට ගොවි බිම වගා කරමූ
අලුත් පිලිවෙත් යොදු ගොවිතැන නසන සතුරන් එහිම මරමූ
එකක් ලැබෙනා විටෙක එය, දෙක වෙන්න ගොවිතැන එලෙස කරමූ
නොබෝ දිනකින් අපේ සිංහල හාල් පිට රටවලත් හරිමූ

නිමි.

## ලිපිනය වෙනස්වීම

**1967 නොවැම්බර් මස පළමුවැනි දින සිට කෘෂිකර්ම ව්‍යාප්ති ආධාර අංශය කොළඹ–1, ඇව්ලන් චතුරශ්‍රය අංක 6 කොටසට ගෙන ගිය බැව් කරුණාවෙන් සලකන්න. මින් පසුව ඔබ එවන සෑම ලිපියක් ම ඉහත සඳහන් ලිපිනයට හෝ තැ. පෙ. 636, කොළඹ–1 යනුවෙන් හෝ ඇමතීමට අමතක නොකරන්න.**